# බුරුම පාලි සාහිත්‍යයේ ආරම්භය හා විකාශය

- වැලිවිට සොරත හිමි

## ආරම්භය

බුරුමයට බුදු දහම ලැබුණේ ක්‍රි. ව. 3 වන සියවසේ අශෝක අධිරාජයාගේ අනුග්‍රහයෙනි. ''සෝණ හා උත්තර'' යන දෙදෙනා වහන්සේ විසින් සුවර්ණ භූමිය යනුවෙන් එකල හැඳින් වූ සියම හා බුරුමයට ධර්මය රැගෙන යන ලදි. ඒ අනුව ක්‍රි. ව. 3 වන සියවසට අයත් ශිලා ලේඛනයක සඳහන් වන්නේ භික්ෂූන් වහන්සේලා සමූහයක් ''විලාත'' නම් ප්‍රදේශයට ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා වැඩම කොට ඇති බවය. ටොලමිගේ සිතියම් හා සංස්කෘත සාහිත්‍යයේ උපකාරයෙන් මෙම විලාත ප්‍රදේශය යනු පහළ බුරුමයේ ''මොන්'' නමින් හැඳින් වූ බොහෝ ජන කොට්ඨාශයක් ජීවත් වූ සමුද්‍රාසන්න ප්‍රදේශයක් බව හඳුනාගෙන ඇත.[1]

මධ්‍යම බුරුමයේ හ්මවුසා (Hmawsa) නම් ස්ථානයේ ක්‍රි.ව. 6 වෙනි සියවසට අයත් පත්ඉරුවල ආන්ධ්‍ර-කණ්ණඩ නම් අක්ෂරවලින් ලියා ඇති අභිධර්මයට අයත් පාඨ මෙන් ම පාලි භාෂාවෙන් ලියා ඇති ශිලා ලේඛන ද හමු වී ඇත.[2]

මේ කාලය වනවිට බුරුමය කාංචිපුරය සමග සමීප සබඳතා පවත්වා ඇති අතර ක්‍රි.ව. 4-7 දක්වා කාලය තුළ පාලි සාහිත්‍යයේ වර්ධනයක් ඉන්දියාව තුළ පැවති නිසා පහළ බුරුමයේ වැසියන් සමග සමීප සබඳතාවක් පවත්වන්නට ඇතැයි සිතිය හැකිය. එම



නිසා පාලි භාෂාවේ දියුණුවක් ද බුරුමයේ පවතින්නට ඇත. එහෙත් මේ කාලයේ ලියවුණා යැයි සැලකෙන එකදු පාලි ග්‍රන්ථයක්වත් දක්නට නොමැත.[3]

ක්‍රි. ව. 11- 13 සියවස් වනවිට බුරුමයේ පාලි සාහිත්‍යයේ යම් දියුණුවක් දක්නට ලැබුණි. ඊට හේතු වූයේ අනුරුද්ධ රජු විසින් ශ්‍රී ලංකාවේ ද සහාය ඇතිව ආරම්භ කරන ලද ධර්ම ශාස්ත්‍රීය සේවාව ඔහුගේ අනුප්‍රාප්තිකයා වූ ''ක්‍යංසිත්ථ'' නම් රජු මගින් පගාන් දේශයේ සිටි ග්‍රන්ථ කර්තෘවරුන් කෙරෙහි දක්වන ලද අනුග්‍රහය නිසාය. ඒ අනුව මේ කාලයේ අභිධර්ම ග්‍රන්ථ හා ව්‍යාකරණ ග්‍රන්ථ බොහෝමයක් රචනා විය. ක්‍රි. ව. 1064 දී ක්‍යංසිත්ථ රජු විසින් කරවන ලද ආනන්ද විහාරයේ වැඩ සිටි ධම්මසේනාපති හිමියෝ කාරිකා නමින් හැඳින් වූ පාලියෙන් බඳනා ලද ව්‍යාකරණ ග්‍රන්ථයක් රචනා කළහ. පසු කලෙක මෙහි ටීකාව වන කාරිකා ටීකාව ද උන්වහන්සේ විසින් ම රචිතය.[4] උන්වහන්සේ විසින් රචනා කරන ලද අනෙක් ග්‍රන්ථ දෙක වන එතිමාසදීපනී හා මනෝහාර කෘති නාම මාත්‍රයට පමණක් සීමා විය. කාරිකාව රචනා කිරීමට ආරාධනා කළ ඥානලම්භීර හිමියන් තථාගතුප්පත්ති නම් ග්‍රන්ථයේ කතුවරයා විය හැකි බව බෝඩේගේ අදහසයි.[5] ඒ අනුව බුරුමයේ පාලි භාෂාවෙන් රචනා වූවා යැයි සැලකෙන ලිඛිත සාධක හමුවන්නේ මේ කාලවකවානුවේ සිටය.

අග්ගවංස හෝ අග්ගපණ්ඩිත යන නාමයෙන් හැඳින් වූ තෙරණුවන් බුරුමයේ පගාන්[6] දේශයේ සිටි වියත් පාලි ව්‍යාකරණඥයෙකි. උන්වහන්සේ බු. ව. 1777 දී රාජ්‍යයට පැමිණි ප්‍යස්සදා චෛත්‍යදායක ''චොස්වා'' රජුගේ කාලයේ විසූ තෙර නමකි. ක්‍රි. ව. 1154 දී උන්වහන්සේ විසින් රචනා කරන ලද සද්දනීතිය බුරුමයේ මෙන් ම ලක්දිව ද සම්භාවනාවට පාත්‍ර වූ ග්‍රන්ථයකි. මෙහි පදමාලා, ධාතුමාලා හා සුත්තමාලා යනුවෙන් කොටස් තුනකි. මේවායින් නාම, ධාතු හා ක්‍රියාපද පිළිබඳ ව සූත්‍රානුසාරයෙන් හා උදාහරණ මගින් විස්තර කර තිබේ. ප්‍රකට

කච්චායන හා මොග්ගල්ලායන යන සම්ප්‍රදාය දෙක මෙන් ම සද්දනීති ව්‍යාකරණ සම්ප්‍රදාය ද ලක්දිව ප්‍රචලිත විය. මහාවිහාරීය සම්ප්‍රදාය විසින් ද එය පිළිගෙන ඇත. මක් නිසාද යත්? සද්දනීති ව්‍යාකරණය ද කච්චායන ව්‍යාකරණය අනුව රචනා වූවක් නිසාය.

පාලි සාහිත්‍යයේ උන්නතිය උදෙසා ලක්දිව පහළ වූ ටීකාචාර්ය සාරිපුත්ත, කාශ්‍යප වැනි තෙරවරුන් ලක්දිව පාලි සාහිත්‍යාම්භරයෙහි යම් සේවාවක් ලබා ඇත්තේ ද එවැනි ම තත්වයක් බුරුම පාලි සාහිත්‍යයේ උන්නතිය උදෙසා මෙහෙවරක් කළ ඡප්පට, ඡපට හෙවත් ඡපද යන නම්වලින් හැඳින් වූ ''සද්ධම්මජෝතිපාල'' හිමියන්ට ලැබේ. බුරුම ශාසන වංශය හා කල්‍යාණි ශිලා ලිපියට අනුව මුන්වහන්සේ ලක්දිවට පැමිණ මහාවිහාරයෙන් උපසම්පදාව ලබා නැවත පගාන් දේශයට වැඩම කොට ඇත. එහි සඳහන් අන්දමට ලක්දිව වැඩ සිටින කාලයේ සිංහල භාෂාව පාලියෙන් ඉගෙන ගෙන ඇත. එහෙත් උන්වහන්සේගේ නාමචාරදීපක ආදි බොහෝ කෘතිවලදී සඳහන් කරන්නේ තමා ලක්දිව භික්ෂූන්ට මෙන් ම විදේශීය භික්ෂූන්ට ද ඉගැන් වූ බවය.[7] මේ කරුණු දෙකම සත්‍ය විය හැකිය. මුල්වර සාමණේරව සිට සිංහල භාෂාව ඉගෙන ගෙන උපසම්පදාව ලබා දසවයස් සම්පූර්ණ වූ විට නැවත බුරුම රට අරිමද්දන නුවරට ගොස් එහිදී ඉගෙන ගත් අභිධර්මය මෙරටට පැමිණි භික්ෂූන්ට උගන්වන්නට ඇත. විශේෂයෙන් මේ කාලය වනවිට අභිධර්මය පිළිබඳව මෙරට භික්ෂූන්ගේ දැනීම දුර්වල ව තිබුණ නිසා ම විජයබාහු පරිවෙණාධිපතීන් විසින් ආරාධනා කරන ලදුව අභිධර්මාර්ථ සංග්‍රහයට සංක්ෂිප්ත ටීකාවක් ලියන සේ ඡප්පට හිමියන්ට ආරාධනා කර ඇත. ඒ අනුව උන්වහන්සේ ලක්දිව වැඩ විසූ කාලයේ සංඛේපවණ්ණනා නමින් අභිධම්මත්ථ සංගහයට අටුවාවක් ලියූ බව බුරුම ශාසන වංසය සඳහන් කරයි. එපමණක් නොව උපසම්පදාවෙන් පසු බුරුම දේශයට වැඩම කළ උන්වහන්සේ බුරුමයේ ථෙරවාද සම්ප්‍රදාය පිහිටුවා



සුවිශේෂී ධර්ම ශාස්ත්‍රීය සේවාවක් සිදුකොට ඇත. උන්වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථ රාශියකි. ඒ අතර කච්චායන පරිවාර ග්‍රන්ථයක් වූ සුත්තනිද්දේස හෙවත් කච්චායනසුත්තනිද්දේසය, සීමාලංකාරටීකා. විනයසමුට්ඨානදීපනී, විනයගුළ්හත්ථදීපනී නාමචාරදීපක, ගන්ධිසාර (හෝ ගණ්ඨිසාර) මාතිකත්ථදීපනී, පට්ඨානගණනාය යන ග්‍රන්ථ ප්‍රධාන තැනක් ගනී.[8]

මින්පසු 13 වෙනි සියවසේ සිටි බොහෝ කතුවරුන් බුරුම පාලි සාහිත්‍යයේ උන්නතිය උදෙසා කටයුතු කළ බව බුරුම ඉතිහාස තොරතුරු විමර්ශනය කිරීමෙන් පැහැදිලි වේ. ඒ අනුව පහත සඳහන් කර්තෘවරුන් විසින් ග්‍රන්ථ සම්පාදනය කර ඇති බව පෙනේ.

- අග්ගධම්මාලංකාර කච්ධජ - ධාත්වත්ථදීපක
- පගාන්හි සුවණ්ණගුහා විහාරයේ වැඩසිටි සද්ධම්මසිරි හිමි සද්දත්ථභේදචින්තා - (ව්‍යාකරණ ග්‍රන්ථයකි)
- විමලබුද්ධි හිමි න්‍යාස හෙවත් මුඛමත්ථදීපනී[9] - (කච්චායන යෝගයට කළ අටුවාවකි)
- පගාන්හි අග්ගපණ්ඩිත හිමි - ලොකුත්පත්ති
- සුභූත චන්දන හිමි- ලිංගත්ථවිවරණ
- ඤාණසාගර හිමි - ලිංගත්ථවිවරණප්පකාසක
- උත්තම හිමි - ලිංගත්ථවිවරණ ටීකා
- පගාන්හි ධම්මදස්සි - වාචවාචක හෝ වාචච්චාවක (ව්‍යාකරණයකි.) (බුද්ධදත්ත හිමියන් පවසන්නේ තමන්ට මේ නමින් හමු වූ ගාථා සියයක් පමණ ඇති

කෘතියෙහි කතුවරයා සද්ධාතේජ නම් පස්වස් ඇති භික්ෂුවක් බවය)[10]

- සද්ධම්මනන්දි - වාචවාචකයට ලියූ අටුවාවකි
- අභය හිමි - සම්බන්ධචින්තා ටීකාව, (මෙය පොළොන්නරු යුගයේ වැඩසිටි සංඝරක්ඛිත හිමියන් ලියූ සම්බන්ධචින්තා නම් කෘතියට ලියන ලද ටීකාවයි) සද්දත්ථභේද චින්තාදීපනී (සද්දත්තභේද චින්තාවේ ටීකාවයි.) ගන්ධවංශයේ කතුවරයා මොහු යැයි සඳහන් වුවත් බුද්ධදත්ත හිමියන් පවසන්නේ මෙය අරිමද්දන නුවර සුවණ්ණගුහා විහාරයේ වැඩසිටි තෙර නමක් විසින් රචිත බවය.[11]
- පගාන්හි ඤාණවිලාස හිමි - සද්දබින්දු ටීකා
- ගුණසාගර හිමි - මුඛමත්ථසාර ව්‍යාකරණය හා ඊට ලියූ ටීකාව
- පගාන්හි අරියවංස හිමි
  - මණිසාරමඤ්ජුසා නම් අභිධම්මත්ථ විභාවිනී අටුවාව, මණිදීප නම් අත්ථසාලිනියට කළ ටීකාව, ගන්ථාභරණ නම් ව්‍යාකරණය හා ජාතක කථා පිළිබඳ අධ්‍යයනයක් වූ ජාතක විසොධන නම් ග්‍රන්ථය.
- අව දේශයෙහි සීලවංස හිමි - පාරායන වත්ථු
- කණ්ටකක්ඛිපනාගිත හිමි[12]
  - සද්දසාරත්ථජාලිනී හා එනමින් ම ලියූ ටීකාව.



මෙකී තෙරවරුන් විසින් 13 වන සියවසේ පාලි සාහිත්‍යයේ උන්නතියට සේවාවක් සිදු කරන ලදි.[13] මීට අමතරව ගිහි උගතුන් කිහිප දෙනෙකු ද 13 වන සියවසේ ග්‍රන්ථකරණයේ නියැලී සිටි බව පෙනේ.

- ක්‍යා ස්වා රජු හො ච්‍යස්වා
  - සද්දබින්දු හා පරමත්ථබින්දු ව්‍යාකරණ දෙක
- ක්‍යා-ස්වාගේ දියණිය
  - විභත්‍යත්ථ නම් විභක්ති සම්බන්ධ කුඩා ග්‍රන්ථය
- නරපතිසිසු රජුගේ ඇමතියෙක්
  - න්‍යාසප්පදීපය (මුඛමත්ථදීපනියේ පුරාණ ටීකාව)[14]
- විජයපුරේ චතුරංගබල ඇමති[15]
  - නිඝණ්ඩු ටීකා, අභිධානප්පදීපිකාවට අටුවාවක් හා කෝලධජ කෘතියට කළ ටීකාව

14 හා 15 වන සියවස්වල ද බොහෝ ග්‍රන්ථ රචකයෝ බුරුම පාලි සාහිත්‍යයේ උන්නතියට සේවාවක් කළහයි සඳහන් වේ. ඒ අතර

- සද්ධම්මඤාණ - ඡන්දොසාරත්ථවිකාසිනී නම් වුත්තෝදය ටීකාව, ඡපච්චයදීපනී (ඡන්දස් ශාස්ත්‍රය පිළිබඳ කෘතියකි)
  - කාතන්ත්‍ර ව්‍යාකරණය පාලියට නඟා ඇත.
- මංගල හිමි - ගන්ධත්ථි ව්‍යාකරණය හෝ ගන්ථට්ඨිප්පකරණය,
  - බුද්ධඝොසුප්පත්ති (මෙය ගයිගර් මහතාගේ අදහසකි.[16] එහෙත්

බුද්ධඝෝසුප්පත්තිය සිංහල හිමි නමක් විසින් රචිත යැයි බොහෝ දෙනාගේ පිළිගැනීමයි)

- පගාන්හි සිරිසද්ධම්මවිලාස හිමි - සද්ධම්මනාසිනි හෙවත් කච්චායනසාර ටීකාව
- මහා අරියවංස හිමි - මණිසාරමඤ්ජූසා (අභිධම්මත්ථවිභාවිනි ටීකාවට ලියූ අනු ටීකාව)
- රට්ඨපාල හිමි - භූරිදත්තජාතක කාව්‍ය, හත්ථිපාලජාතක කාව්‍ය, සංවරජාතක කාව්‍ය
- ධම්මචේතිය රජු[17] (ක්‍රි.ව. 1472-1492) කල්‍යාණි ශිලාලිපි[18]

ඉහතින් සඳහන් කරන්නට යෙදුනේ උතුරු බුරුමයේ විසූ කතුවරුන් විසින් රචනා කරන ලද ග්‍රන්ථයන් පිළිබඳ සටහනකි. මීට අමතරව දකුණු බුරුමයේ විසූ බොහෝ කතුවරුන් ද බුරුම පාලි සාහිත්‍යයේ උන්නතියට මහත් වෙහෙසක් ගෙන ඇති බව පෙනේ. 12 වෙනි සියවසේ පැවති නොයෙක් ආක්‍රමණ නිසා පහළ බුරුමයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු යම් ප්‍රමාණයකට අඩාල වී ඇති අතර නැවත එහි පාලනය පිහිටුවීමෙන් පසු රාමඤ්ඤ දේශයේ බුදු සමයේ වර්ධනයක් දක්නට ලැබුණි. ලක්දිව අනුරාධපුර අවසන් භාගයේ හා පොළොන්නරු රාජධානියේ මුල් අවදියේ පැවති ආක්‍රමණ නිසා රාමඤ්ඤ දේශයෙන් උපසම්පදාව ගෙන ඒමට සිදු වූ බව සඳහන් වේ. ඒ අනුව මේ කාලයේ බුරුමයේ පාලකයා වූ අනුරුද්ධ රජුගේ (ක්‍රි. ව. 1044-1070) සහයෝගය ඇතිව රාමඤ්ඤ දේශයෙන් භික්ෂූන් ගෙන්වා ගෙන ඇත. කෙසේ නමුත් පහළ බුරුමයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු 12 වෙනි හෝ 13 වැනි සියවසේ දී සාරිපුත්ත නම් තෙර



කෙනෙකුගේ මූලිකත්වයෙන් ආරම්භ වී ඇත. සාසනවංසයට අනුව උන්වහන්සේ රන්ගුන් ආසන්නයේ දල නම් ප්‍රදේශයේ උත්පත්තිය ලබා වයසට ගිය පසු සාමණේරවරයෙකු වශයෙන් පැවිදි ව පසුව පගාන් දේශයේ සිටි ඡප්පට හිමියන් හා ලංකාවෙන් එහි ගොස් සිටි ආනන්ද නම් තෙර කෙනෙකුන් සමීපයේ උපසම්පදාව ලබා ඇත. පසුව නරපතිසිදු රජුගේ ආරාධනයෙන් දකුණු බුරුමයට වැඩම කොට සීහළ සංඝ පරම්පරාව ආරම්භ කළේය. උන්වහන්සේ විසින් රචනා කරන ලද කෘතිය මුල් යුගයේ රචනා වූ කෘතිවලින් වෙනස් ය. එනම් එය ධම්මසත්ථා යනුවෙන් හැඳින් වූ නීති සංග්‍රහයක් විය.[19]

දකුණු බුරුමයට වරින්වර එල්ල වූ සතුරු ආක්‍රමණ හා දේශපාලන අස්ථාවරත්වය නිසා පගාන් දේශයේ ඇති වූ පාලි සාහිත්‍යයේ දියුණුව හා සමාන දියුණුවක් මෙහි ඇති නොවුණි. නමුත් හංසවතී (පේගු) මුත්තිමනගර (මර්තබාන්) හා ථාටෝන් යන ස්ථානවල යම් පමණකට පාලි සාහිත්‍ය කෘති රචනා වී තිබේ. 1370 දී පමණ පේගු රාජ්‍යයේ පාලනය ගෙන ගිය සේතිබින්ද රජුගේ මවගේ අනුශාසක වූ මේධංකර නම් තෙරනමක් කාමාදි භවයන්හි ඇති ආදීනව ඉස්මතු කරමින් ලොකදීපසාර හෝ ලොකප්පදීපකසාර නම් කෘතියක් රචනා කර ඇත. සාසනවංසයට අනුව මුන්වහන්සේ බුරුම රටේ මර්තබන් (මුත්තිම) නගරයෙහි සිට ලක්දිව වනවාසී භික්ෂූන් හමුවට පැමිණ ත්‍රිපිටක ධර්මය හදාරා නැවත සිය රටට ගිය තෙර නමකි[20] මුන්වහන්සේ බුරුම රාජ්‍යයේ කෙනෙක් වුවත් පරණවිතාන ප්‍රමුඛ ශ්‍රී ලාංකික විද්වතුන් පවසන්නේ මුන්වහන්සේ පස්වැනි පැරකුම් රජුගේ කාලයේ දිඹුලාගල ආරණ්‍ය සම්ප්‍රදාය නියෝජනය කළ පසු කලෙක රාමඤ්ඤ දේශයේ වාසය කළ[21] මේධංකර සංඝරාජයන් යන බවයි.[22] ග්‍රන්ථාවසානයේ දැක්වෙන තොරතුරුවලට අනුව ද මුන්වහන්සේ රාමඤ්ඤ දේශයේ සිරිරතනපුර නැමති මුත්තිම නගරයේ ස්වර්ණාලිප්ත විහාරයක වැඩ සිටි සංඝරාජයන් බව සඳහන් වේ. උන්වහන්සේ ලක්දිවට

පැමිණ අරඤ්ඤවාසී භික්ෂූන් සමීපයේ ඉගෙන ගෙන ගොස් බුරුම රටේ දී ලොකප්පදීපසාර ග්‍රන්ථය රචනා කළ බව ද සඳහන් වේ.[23] පරණවිතාන ආදි විද්වතුන් මුන්වහන්සේ ශ්‍රී ලාංකික භික්ෂුවක් බව පවසන්නේ ඇතැම් විට උන්වහන්සේ ලක්දිවදී ධර්ම ශාස්ත්‍රීය කටයුතු ඉගෙන ගත් නිසා විය හැකිය. නැතහොත් පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී ලක්දිව මේධංකර නමින් තෙර නමක් සිටි නිසා විය හැකිය. කෙසේ නමුත් ග්‍රන්ථයේ සඳහන් වන කරුණ මෙහි දී පිළිගත යුතුය. ක්‍රි. ව 14 වැනි සියවසේ මැද භාගයේ විසූවේ යැයි සඳහන් මහා සුවණ්ණදීප නම් හිමි නමක් අභිධම්මත්ථවිභාවිනියේ අනුටීකාවක් වන අළේග්ගුසාර හෝ අළේග්ගුසාරදීපනී නම් කෘතියක් කළ බව මණ්ඩලේහි නම් ස්ථානයෙන් හමු වූ පිටපතක සඳහන් වේ.[24] ථාටෝන්හි විසූ මහායස නම් හිමිනමක් කච්චායනභේද හා කච්චායනසාර නම් කෘති දෙකක් සම්පාදනය කර ඇති අතර ඉන් පළමුවැන්න කච්චායන ව්‍යාකරණයේ වාංමාලාව පිළිබඳව වන අතර දෙවැන්න කච්චායනයේ සංක්ෂේපයකි. උන්වහන්සේ විසින් කච්චායනසාරයට ටීකාවක් ද ලියන ලදි. පගාන්හි විසූ සද්ධම්මවිලාස නම් හිමියන් ද සම්මෝහවිනාසිනී නමින් කච්චායනසාරයට ටීකාවක් ලියන ලදි.

16 වෙනි සියවසේ පාලි සාහිත්‍ය ඉතිහාසයෙහි සද්ධම්මාලංකාර හා මහානාම හෙවත් මහානන්ද නමින් සිටි භික්ෂූන් දෙන ම ඉතා ප්‍රසිද්ධය. සද්ධම්මාලංකාර හිමියන් හංසවතී නැතහොත් හංසාවතී නමින් පේගු රාජ්‍යයේ ප්‍රසිද්ධ ගම්මානයක වාසය කළ අතර උන්වහන්සේ විසින් පට්ඨානසාරදීපනී නම් පට්ඨානප්පකරණයේ ටීකාව රචනා කර ඇත. මහානාම තෙරුන් ද හංසාවතී වැසි භික්ෂුවක් වන අතර ආනන්ද වනරතන තිස්ස තෙරුන් විසින් රචිත අභිධම්ම මූලටීකාවට මධුරසාරත්ථදීපනී නම් අනු ටීකාව රචනා කර ඇත. මෙනමින්ම ටීකාවක් මහාධම්මරාජගුරු ආනන්ද නම් තෙරනමක් විසින් බුරුම බසින් රචනා කොට ඇත. ප්‍රණාම ගාථාවන්හි එන



තොරතුරුවලට අනුව මහානන්ද නම් තෙරනමක් විසින් මෙය රචිත බව කියවේ.[25] මහානන්ද යන පදය "මහා - ආනන්ද" යනුවෙන් ද ගත හැකි බව බුද්ධදත්ත හිමියන්ගේ අදහසයි.[26] එය පිළිගත හැකි කාරණයකි. මන්දයත් ග්‍රන්ථයේ බොහෝ ස්ථානයක ආනන්ද යන නම සඳහන් වී තිබීම නිසාය. ග්‍රන්ථාවසාන නිගමනයේ ද සඳහන් වන්නේ "බුදුන්ගේ බාල සොහොයුරාගේ නම ඇති තෙර කෙනෙකුන් විසින්" යන්නයි. බුදුන්ගේ බාල සොහොයුරා නන්ද කුමරුය. බුද්ධදත්ත හිමියන් පවසන්නේ ආනන්ද හිමියන් ද බුදුරජුන්ගේ ඤාති සහෝදරයෙකු බැවින් ආනන්ද යන නම ම ගතයුතු බවය.[27]

ලාඔසයේ සිරිමංගල නමින් සිටි තෙරනමක් මංගල සූත්‍රයේ ටීකාව වූ මංගලදීපනී නැතහොත් මංගලත්ථදීපනිය ලියූ අතර එය වර්තමානයේ සියමේ මහත් ගෞරවාදරයට පාත්‍ර වී ඇත.[28]

බුරුම පාලි සාහිත්‍යයට අනුව මුන්වහන්සේ විසින් රචනා කරන ලද තවත් ග්‍රන්ථ දෙකකි. එනම් අත්ථසාලිනී අත්ථයොජනා හා සම්මොහ විනොදනී අත්ථයෝජනා යන ග්‍රන්ථ දෙකයි. එහෙත් ග්‍රන්ථයේ සඳහන් වන්නේ අභිනවපුර නගරයට වයඹ දෙස පිහිටි පනසාරාමයෙහි විසූ ඤාණකිත්ති නම් තෙර නමක් මෙම ග්‍රන්ථ දෙකෙහි කතුවරයා බවය.[29]

ග්‍රන්ථයේ සඳහන් කරුණ හැරදමා වෙනත් තැනක සඳහන් වන දෙයක් පිළිගත නොහැකිය. සද්ධාතිස්ස හිමියන් පවසන්නේ ද මෙම ග්‍රන්ථ දෙකෙහි කතුවරයා ඤාණකිත්ති හිමියන් බවය. සිරිමංගල හිමියන් රචනා කරන්නට ඇත්තේ අත්ථසාලිනිඅට්ඨකථායෝජනා හා සම්මෝහවිනොදනී අට්ඨකථා යොජනා යන ග්‍රන්ථ දෙක බවය.[30] එමනිසා මෙම ග්‍රන්ථද්වයේ කතුවරයා ඤාණකිත්ති හිමියන් යැයි සිතීම උචිතය.

16 වෙනි සියවසේ විසූ තවත් තෙරනමක් වූයේ සද්ධම්මකිත්ති හිමියන්ය. උන්වහන්සේ පහළ වූ යුගයේ සිටි ෂාන් නායක මොක්යින් අව ප්‍රදේශය ආක්‍රමණය කොට ඔහුගේ පුත්

තොහන්බවා එහි පාලකයා කළේය. ඔහු කෲර රජ කෙනෙක් වූ අතර භික්ෂූන් හිංසනයට ද ලක් කළේය. මේ අනුව 16 වෙනි සියවස මුල් භාගයේ බුරුම රට කොටස් තුනකට බෙදී ගියේය.[31] වයඹ දිග ප්‍රත්‍යන්ත දේශය ෂාන් තායි ගොත්‍රිකයන් විසින් ද, අවා ප්‍රදේශය ෂාන් කුමාරවරුන් විසින් ද, දකුණු බුරුමය මොන් පාලකයන් විසින් ද පාලනය ගෙන යන ලදි. මෙම ආක්‍රමණශීලි පිළිවෙත 15 වන සියවසේ අග භාගයේ පටන් ම පැවතුණි. අවාහි සිහසුන්ගත වූ තොහන්බවා (ක්‍රි. ව. 1527-1543) රජුගෙන් භික්ෂු සංඝයාට අත්වූයේ ඉතා බලවත් හානියකි. ඔහු විසින් සගායිං, පින්යා හා අවා දේශවල සිටි භික්ෂූන් තුන්දහසකට අධික ප්‍රමාණයක් මරවන ලදි.[32] වෙහෙර විහාර සුන්බත් කරන ලදි. බොහෝ දෙනා සටන්වලදී මෙන් ම මං පැහැරීම් ගම් නගර පැහැරීම් ආදියෙන් විනාශයට පත්වූහ. මෙබඳු සාමාජික පසුබිමක් නිර්මාණය වූ නිසා තොහන්බවාගේ පාලන සමයේ සිටි භික්ෂූන් වහන්සේලා ද බෞද්ධයෝ ද එවක ස්වාධින රාජ්‍යයක් වූ කේතුමතී නුවර රැකවරණ ලැබූහ. එවක එහි භික්ෂූන් අතර සුරා පානය සම්බන්ධයෙන් විවාදයක් හටගත් නිසා මහා පරක්කම නම් හිමිනමක් විසින් සුරාවිනිච්ඡය නමින් ග්‍රන්ථයක් රචනා කරන ලදි.[33]

තොහන්බවාගේ පාලන සමයේ රට තුළ අයහපත් වාතාවරණයක් පැවති යුගයේ පහළ වූ සද්ධම්මකිත්ති හිමියන් ද කල්පනා කළේ ධර්ම ග්‍රන්ථ අවබෝධ කර ගැනීමට නම් භාෂා ඥානය දියුණු විය යුතු බවය. ඒ අනුව උන්වහන්සේ එකක්ඛරකොස නම් කෝෂ ග්‍රන්ථයක් රචනා කළහ. මෙය එක් අකුරකින් වචනයන්ගේ අර්ථ දැක්වීම සඳහා පද්‍යයෙන් කරන ලද ග්‍රන්ථයකි. සංස්කෘත ඒකාක්ෂරකෝෂය අනුව යමින් අවිද්‍යමාන වූ බුද්ධ වචනය විස්තර කිරීම සඳහා මෙම ග්‍රන්ථය රචනා කර තිබේ. පසුකාලීනව එයට ටීකාවක් ද උන්වහන්සේ විසින් ම රචනා කරන ලදි.



බුද්ධදත්ත හිමියන්ගේ විස්තරයන්ට අනුව 16 වෙනි සියවසේ රට තුළ නොයෙක් ආරවුල් ඇතිව තිබුණත් සාහිත්‍ය ව්‍යාපාරයේ අඩුවක් වී නොමැත. උන්වහන්සේ සඳහන් කර ඇති බුරුම පාලි සාහිත්‍යයේ කෘති විශාල ප්‍රමාණයක් මේ යුගයේ දී රචනා වී තිබේ. බු. ව. 2192 දී හෙවත් ක්‍රි. ව. 1549 දී දාඨානාගරාජගුරු නම් තෙර නම නිරුත්තිසාරමඤ්ජුසා නමින් න්‍යාස හෙවත් මුඛමත්ථදීපනියට ටීකාවක් කරන ලදි. මෙය න්‍යාසයේ දෙවෙනි විශාල ටීකාවයි. මීට පෙර සඳහන් වූ නරපතිසිසු රජුගේ කාලයේ විසූ ඇමතියෙකු විසින් න්‍යාසප්පදීපය සම්පාදනය කර තිබේ. කතෘ නාම සන්දර්ශනයේ දී න්‍යාසත්ත දීපනිය කළ කාලය, ඒ කාලය වනවිට රාජ්‍ය ගෙනගිය රජු කවුරුන් ද යන ආදි තොරතුරු අඩංගු කොට ඇත.[34]

මෙම ග්‍රන්ථය රචනා වන කාලය තුළ මුළු බුරුම රාජ්‍යයේ ම අගරජු වශයෙන් පාලනය ගෙනගියේ ත-බින්-ශ්වේ නම් පාලකයාය. මුන්වහන්සේ සඳහන් කරන පරිදි සිරිනන්දපවරාධිපති වශයෙන් හඳුන්වන රජු සගයින් නුවර ප්‍රාදේශීය නායකයා වශයෙන් කටයුතු කළ කෙනෙක් විය හැකිය. ඇතැම්විට ත-බින්-ශ්වේ රජු විසින් මේ ප්‍රදේශය පාලනය කිරීම සඳහා ඔහු පත් කළා විය හැකිය. ත-බින්-ශ්වේ රජු ආක්‍රමණශීලී නායකයෙක් නිසා ඔහුගේ නම සඳහන් නොකොට තම ප්‍රදේශ පාලක රජතුමාගේ නම සඳහන් කිරීම උචිත යැයි හැඟුන නිසා මුන්වහන්සේ සිරිනන්දපවර රජුගේ කාලයේ දී මෙය රචනා කළ බව සඳහන් කරන්නට ඇත.

රණකාමී පාලකයෙක් වූ ත-බින්-ශ්වේ (Ta-Bin-Shwe) 1555 දී ඔහුගේ සෙන්පතියෙක් වූ බයින්නාවුන් සමඟ එක්ව උක්ත කෲර පාලකයා පළවා හැර ශාසනයට අනුග්‍රහය දක්වන්නට විය. බයින්නාවුන් (ක්‍රි. ව. 1551-1581) ත-බින්-ශ්වේගේ සොහොයුරා බව කියවේ.[35] එමනිසා ම ඔහුගෙන් පසු බුරුමයේ පාලකයා වූයේ ඔහුය. මනුෂ්‍ය ඝාතනය හිංසාවක් යැයි සැලකූ මොහු ආගමික ජීවිතයක් ගත කර ඇතැයි ඩී. සී. පී. හෝල් අදහස් කරයි.[36] එහි

ම සඳහන් වන අන්දමට පේගුවෙහි නැති වී ගිය සෞභාග්‍යය නැවත ඇති කිරීමෙහි ලා ඔහු වෙහෙස මහන්සි විය. ලෝක ප්‍රසිද්ධ ශ්වේදගොන් චෛත්‍යය ද ප්‍රතිසංස්කරණය කළේය. භික්ෂූන්ට නන් අයුරින් අනුග්‍රහය දක්වා ත්‍රිපිටක ග්‍රන්ථ පිටපත් කර බෙදා හැරියේය.[37] එපමණක් නොව ක්‍රි. ව. 1555 දී ලංකාවේ දන්තධාතු මන්දිරය අසලින් ඉඩමක් ලබාගෙන එහි නිරන්තරයෙන් දැල්වෙන පරිදි කැටයමින් අලංකාර කරන ලද පහනක් කළ බැව් සඳහන් වේ. තවද ඒ රජ තමාගේ හා තම දේවියගේ හිසකෙස්වලින් මුසුන්නක් සාදා දාළදා මැඳුර ඇමදීම සඳහා එවා ඇත.[38] මෙවැනි ධාර්මික රජ කෙනෙක් සිටි නිසා සාහිත්‍ය ව්‍යාපාරය ද දියුණු වන්නට විය.

මෙ කල අවා රාජ්‍යයේ හෙවත් රතනපුරයේ මහානරපති හෙවත් නරපති රජුගේ (ක්‍රි. ව. 1443-1469) කාලයේ විසූ සද්ධම්මපාලමහාරාජගුරු නැමති බුරුම තෙරුන් විසින් නෙත්ති විභාවිනී නම් නෙත්තිපුරාණ ටීකාව රචනා කරන ලදි. බුද්ධදත්ත හිමියන් පවසන්නේ මෙම ග්‍රන්ථය රචනා කර ඇත්තේ බු.ව. 2108 වැන්නේ දී බවය. එය ග්‍රන්ථාවසානයේ එන ගාථාවකින් ද පැහැදිලි වේ.[39]

ඒ අනුව මෙය ක්‍රි. ව. 1565 විය යුතුය. මේ කාලයේ බුරුමයේ පාලකයා වූයේ බයින්නාවුන් නම් ත-බින්-ශ්වෙගේ සොහොයුරාය. ඒ අනුව බුද්ධදත්ත හිමියන් දක්වන නරපති රජුගේ කාලයේ රචිත යැයි සඳහන් කරන මෙම කතුවරයාගේ ග්‍රන්ථ පිළිබඳ ගැටළු සහගත බවක් දක්නට ලැබේ. ග්‍රන්ථයේ සඳහන් වන අන්දමට බු.ව. 2108 වැන්නෙහි රාජ්‍යය ගෙන ගියේ බයින්නාවුන් බව බුරුම ඉතිහාසයට අනුව තහවුරු කළ හැකිය. මොහුගේ නම ග්‍රන්ථයේ සඳහන් වන්නේ සම්බන්ධපාල යනුවෙනි. එසේම මෙම ග්‍රන්ථය ශකරාජ වර්ෂ 926 වැන්නේ නිකිණි මස පුර නවවක් දා හිරු උදාවන වේලේහි ලියා නිම වූ බව සඳහන් කිරීමෙන් පෙනී යන්නේ රාත්‍රිය මුළුල්ලේ මෙම ග්‍රන්ථය ලියමින් සිටි බවය.[40]



මේ කාලයේ විසූ සුවණ්ණරංසි නම් හිමිනම ගන්ධාභරණ නම් පුරාණ ටීකාව රචනා කර ඇත්තේ 1575 දීය.[41] ග්‍රන්ථාවසාන ගාථාවන්ගේ තොරතුරුවලට අනුව මුන්වහන්සේ බුරුමයේ විසූ සංඝරාජ කෙනෙක් බව කියවේ.[42] 16 වෙනි සියවසේ අග භාගයෙහි රාජ්‍යයට පැමිණි බයින්නාවුන්ගේ පුත් නන්දබායිං (ක්‍රි.ව. 1581-1599) රජුගේ කාලයේ දී ද රටේ පැවති යහපත් බව මුළුමණින් ම අයහපත් තත්වයට පත්විය. මතක ඇති කාලයක පේගු රාජ්‍යයේ විසූ තලයිං[43] භික්ෂූන්ට ඇති වූ මහත් රාජභය පැමිණියේ මොහුගෙනි. එමනිසා මොහුගේ කාලයේ සාහිත්‍ය දියුණුවක් ඇති නොවුණි.

17 වන සියවස වනවිට බුරුම පාලි සාහිත්‍යයේ යම් දියුණුවක් ඇති වූ බව දක්නට ලැබේ. මුල්ම අවදියේ රචනා වූවා යැයි සැලකිය හැක්කේ කච්චායනභේද පුරාණ ටීකාවයි. මෙය කුඩා ග්‍රන්ථයක් වන අතර අනුරුද්ධ ආචාරීන්ගේ අභිධර්මාර්ථ සංග්‍රහයක් වන පරමත්ථවිනිච්චයට කරන ලද පුරාණ ටීකාවයි. එය බු. ව. 2151 හෙවත් ක්‍රි. ව. 1608 දී බුරුම රට රතනපුරයෙහි විසූ අරියාලංකාර හිමියන් විසින් රචිතය. ඒ බව ග්‍රන්ථාවසානයේ දැක්වෙන කතෘ සංදර්ශන ගාථාවලින් පෙනේ.[44] ක්‍රි.ව. 1615 දී පෘතුගීසි ආක්‍රමණ ම්‍රොහෝං අගනුවර දක්වා පැතිර ගියේ නමුත් එය සාර්ථක නොවීය. මෙසේ උතුරු හා දකුණු බුරුමයේ පාලකයන් හා පෘතුගීසීන් අතර ඇති වූ යුද්ධමය වාතාවරණය නිසා බෞද්ධ තත්වය වරින් වර අවුල් වූ බවක් ද දක්නට ලැබේ. එහෙත් විදේශ ආක්‍රමණ මධ්‍යයේ වුව ද එහි ථෙරවාදී බුදුදහම තද පරිහානියකට පත් නොවුණි.[45]

ඊට ප්‍රධාන හේතුවක් වූයේ 16 වෙනි සියවසේ කොටස් තුනකට බෙදී ගිය බුරුම රාජ්‍යය බයින්නාවුං රජුගේ මුණුබුරු මහාධම්මරාජ විසින් (ක්‍රි. ව. 1617) නැවතත් ඒකාබද්ධ කිරීමයි. ඔහුගේ අගනුවර ලෙස පේගු නුවර තෝරා ගැනීම පහළ බුරුමයේ භෞතික මෙන් ම ශාසනික හා සාහිත්‍ය දියුණුවට හේතුවිය. මෙවකට බුරුම දේශයේ පැවතියේ අරිධ මහායාන

07 FEB 2014

බුදුදහමක් බව සඳහන් කරන කොටගම වාචිස්සර හිමියෝ එහි ථෙරවාදී බුදුදහම ද බලපැවැත් වූ බව පිළිගනිති.[46]

17 වෙනි සියවස වනවිට පේගු, උතුරු බුරුමයේ අව, ප්‍රෝම් හා සගයින් (ජෙයාපුර) යන ස්ථානයන්හි පාලි උගතුන් සිටි බවට තොරතුරු හමුවේ. රටේ පැවති අවුල් වියවුල් තත්වය මත මේ යුගයේ සිටි ප්‍රසිද්ධ උගතෙක් වූ ත්‍රිපිටකාලංකාර රාජගුරු හිමියන්. ස්වාධීන රාජ්‍යයක් වශයෙන් පැවති ප්‍රෝම් නගරයේ වාසය කළේය. රාජධානි ඒකාබද්ධ කිරීමත් සමඟ ප්‍රෝම් රාජ්‍යය ද බුරුම පාලනයට යටත් විය. ඉන්පසු එහි සිටි ත්‍රිපිටකාලංකාර හිමියන් අවා ප්‍රදේශයට කැඳවන ලදි. එහිදි උන්වහන්සේ පාලි සාහිත්‍යයේ දියුණුවක් ඇති කරමින් ග්‍රන්ථකරණයේ නියැලුණේය. උන්වහන්සේගේ කෘති ලෙස සැලකෙන්නේ අත්ථසාලිනියේ ආරම්භක ගාථා 20 ට කරන ලද අටුවාව වූ වීසතිවණ්ණනා, යසවඩ්ඩනවත්ථු හා සැරියුත් හිමියන්ගේ විනය සංගහයට කළ විනයාලංකාර ටීකාවයි.[47]

මෙයින් විනයාලංකාර ටීකාව පාලිමුත්තකවිනයවිනිච්චයට ලියූ ටීකාවයි. මෙයට පෙර පොළොන්නරු යුගයේ සිටි සාරිපුත්ත සංඝරාජයන් විසින් ටීකාවක් ලියා ඇති නමුත් එයට අභිනව ටීකාවක් වශයෙන් විනයාලංකාර ටීකාව රචනා කර තිබේ. ත්‍රිපිටකාලංකාර හිමියන් පිළිබඳ ව තොරතුරු සපයන සාසනවංසදීපිකා නම් කෘතියේ සඳහන් වන්නේ මුන්වහන්සේ මුලදී පාලි සාහිත්‍යයේ දියුණුවට මග පාදමින් සිටි බවය. දිනක් බුරුම රටේ තිබෙන ශ්‍රී පාදය වැඳිමට ගොස් එන අතරතුර කුබණනුවර ස්වර්ණ ගුහාවේ වසන ජම්බුධජ තෙරුන් වෙත ගොස් කථාබස් කොට නැවත පැමිණ රතනපුරයට ගොස් පසුකලෙක රාජවංස පර්වතයට[48] ගොස් වනවාසී භික්ෂුවක් ලෙස වාසය කොට ඇත. රාජවංස පර්වතය ශාන්ත වූ පුද්ගලයන්ට වාසස්ථානයක් වූ නිසා මුන්වහන්සේ අවසන් කාලයේ එහි භාවනානුයෝගීව වැඩ සිටින්නට ඇතැයි සිතිය හැකිය.



ත්‍රිපිටකාලංකාර හිමියන්ගේ සමකාලීනයෙක් වූ ජම්බුධජ හිමියන් විසින් පදයන්ගේ නිරුක්ති දැක්වීම සඳහා ඤාණසද්ධම්ම නැමති තෙරනමකගේ ආරාධනයෙන් නිරුත්තිසංගහ නමින් ව්‍යාකරණ ග්‍රන්ථයක් රචනා කරන ලදි. එහි සඳහන් වන අන්දමට මුන්වහන්සේ බෝධොදධි නැමැති ගමේ උපන් තැනැත්තෙකි.[49] පසුකලෙක මුන්වහන්සේ සංවණ්ණනානයදීපනි රූපභේදපකාසිනි යනුවෙන් ව්‍යාකරණ ග්‍රන්ථ දෙකක් ද සම්පාදනය කළහ. එසේ ම විනය පිටක ග්‍රන්ථ හා අටුවා බුරුම භාෂාවට පරිවර්තනය ද කළහ. උන්වහන්සේට සමකාලීන වූ මණිරතන නම් තෙරනමක් බුද්ධඝෝෂ හිමියන්ගේ අත්ථසාලිනී, සම්මෝහවිනෝදනී හා කංඛාවිතරණී යන අටුවා මෙන් ම අභිධම්මත්ථවිභාවිනී හා සංඛේපවණ්ණනා යන අභිධර්ම ටීකා ග්‍රන්ථ බුරුම බසට නැගීය.

අවාහි නයයින්ගුඅ (Nayyingua) හි සාරදස්සී හිමියන් අභිධර්මයේ සප්තප්‍රකරණයේ අසීරු තැන් විවරණය කරමින් කළ ගුල්හත්ථදීපනී නම් කෘතිය ද එබඳු ම කෘතියක් වූ විසුද්ධිමග්ගයට කළ විසුද්ධිමග්ගගණ්ඨිපදත්ථ නම් පාලි කෘති දෙකේ හා නෙත්තිප්පකරණයේ බුරුම පරිවර්තනයේ කතුවරයා ද වේ.[50] 17 වන සියවසේ තවත් ප්‍රසිද්ධ භික්ෂුවක් වූයේ මහාකාශ්‍යප හිමියන්ය. මුන්වහන්සේ විසින් අභිධම්මත්ථ ගණ්ඨිපද නම් අභිධර්මයේ කඨින ශබ්දවලට ව්‍යාඛ්‍යාවක් කරන ලදි.[51] බුද්ධදත්ත හිමියන්ට අනුව මේ යුගයේ සිටි තවත් තෙරවරු කිහිප දෙනෙකු විසින් ද ග්‍රන්ථ රචනා වී තිබේ.

බුරුම රට විජයපුර අසල අභයගිරි පර්වතයෙහි වැඩසිටි මහාවිජිතාවී නම් තෙරනම බු. ව. 2170 දී (ක්‍රි. ව. 1637) කච්චායන ව්‍යාකරණයට කච්චායන වණ්ණනා නමින් ටීකා ග්‍රන්ථයක් සම්පාදනය කර ඇත. ලක්දිව ව්‍යාකරණ ග්‍රන්ථ ලියූ සියල්ලන්ට ම වැද නමස්කාර කර තිබීම මෙහි ඇති සුවිශේෂී කරුණකි.[52]

මීට අමතරව වාචකොපදේස හා වාචකොපදේස ටීකාව ද මුන්වහන්සේගේ කෘති දෙකකි. වාචකොපදේසයේ සඳහන් පරිදි

එම ග්‍රන්ථය රචනා කර ඇත්තේ නූගත් අයට උපදෙස් ලබාදීම සඳහාය.[53]

16 වෙනි සියවසේ අග භාගයේ සිටි උත්තමසික්ඛ නම් තෙරුන් බණවර විසි හතරකින් යුත් කච්චායන භේද ටීකා නම් ග්‍රන්ථය රචනා කර තිබේ. කර්තෘ සංදර්ශන ගාථාවල මේ ග්‍රන්ථය රචනා වූයේ කුමන කාලයේ දී ද, කවුරුන් විසින් ද යන්න සඳහන් වී ඇති අතර අවසානයෙහි උන්වහන්සේ ප්‍රාර්ථනාවක් ද සිදු කරනු ලබයි. එනම් මේ සම්බුද්ධ ශාසනය ලොව පවත්නා තාක් කල් කච්චායනභෙද වණ්ණනාව ද නිරාකුලව පවතීවා යන්නයි.[54] එයින් උන්වහන්සේ තමන්ගේ ග්‍රන්ථයට වඩා 'සලේ' නුවර වැසි මහායස තෙරුන් විසින් රචිත කච්චායනභේදයට මුල් තැනක් දී ඇති බව පෙනේ.

කාල නියමයක් පිළිබඳ ව තොරතුක් ගත නොහැකිමුත් බු. ව. 2200 ට පෙර එනම් ක්‍රි. ව. 1650 දී පමණ බුරුම රට විසූ සද්ධම්මගුරු නම් තෙර නමක් විසින් ජාති ගුණ ක්‍රියාදීන්ගේ විස්තර දැක්වීම සඳහා සද්දවුත්ති නම් කෘතිය කළ බව දැක්විය හැකිය. එහෙත් බුරුම සාහිත්‍ය වංශයේ සඳහන් වන්නේ අරිමද්දන නුවර විසූ සද්ධම්මපාල තෙරුන් විසින් සම්පාදිත බවය. එහෙත් ග්‍රන්ථාවසානයේ කර්තෘ සංදර්ශන ගාථාවලින් පෙනෙන්නේ සද්ධම්මගුරු නම් තෙරුන් විසින් මෙය රචනා කර ඇති බවය. එසේම පොතේ නම සද්ධම්මපකාසක නම් බව එහි ඇති වාක්‍යයෙන් පෙනේ.[55] ඒ අනුව බුරුම පාලි සාහිත්‍ය වංශය හා සංසන්දනය කර බැලීමේ දී පරස්පර කරුණු එහි අඩංගු වී ඇති බව පෙනේ.

17 වන සියවසේ මැද හා අග භාගය වනවිට චීන ආක්‍රමණ හා වෙනත් විවිධ හේතු නිසා විචාරශීලී බවින් තොර මිථ්‍යා විශ්වාසයන් හි වෙලී ගත් සමාජයක් බුරුමය තුළ ඇති විය. එහෙත් ක්‍රි. ව. 1651 දී රජ පැමිණි මහාපවරධම්මරාජලොකාධිපති රජ බුදු සමයේ සංවර්ධනයක් ඇති කරමින් පැරණි චාරිත්‍ර බුරුමය තුළ පිහිටුවීමට උත්සහ ගත්තේය. මේ සමයේ



අග්ගධම්මාලංකාර හිමි අභිධම්මත්ථසංගහ, ධම්මසංගනී, ධාතුකථා, යමක හා පට්ඨාන යන කෘති බුරුම භාෂාවට පරිවර්තනය කළේය.[56]

ගැඹුරු අභිධර්ම පිටකයේ ග්‍රන්ථ පරිවර්තනය කරන්නට තරම් මේ ලේඛකයා තුළ තිබූ ශක්තිය, ක්‍රියාශීලි බව පුදුම සහගතය. එසේම අභිධර්ම අධ්‍යයනය කෙරෙහි බුරුම භික්ෂූන් තුළ පැවති උද්‍යෝගය ද මෙයින් පැහැදිලි වේ. රජු සමඟ කුළුපග සම්බන්ධතාවක් පැවති මුන්වහන්සේ මහාපවර රජුගේ ආරාධනයෙන් රාජවංසසංඛේප නමින් රජ පරම්පරා පිළිබඳ කුඩා වංසකථාවක් රචනා කළහ.

17 වන සියවසේ මේ රජුගේ කාලයේ ම ප්‍රසිද්ධියට පත්ව සිටි තිලෝකගුරු යන නාමයෙන් හැඳින් වූ තෙර නමක් ධාතුකථාටීකා වණ්ණනා හා ධාතුකථා අනුටීකා වණ්ණනා යන නම්වලින් ධාතුකථාවට ටීකාවක් හා අනුටීකාවක් ද යමක වණ්ණනා නමින් යමකයට හා අභිධර්ම පිටකයේ ගැඹුරුම ප්‍රකරණයක් වන පට්ඨානප්‍රකරණයට ටීකා දෙකක් ද රචනා කළහ.[57]

මුන්වහන්සේ පිළිබඳ අපූරු කථා පුවතක් ඇත. කුඩා කාලයේ "සිබුං" චෛත්‍යය අසල පිහිටි ජේතවන විහාරයෙහි වැඩවසමින් සිට පසුකලෙක සිවුරු හැර යාමට කැමතිව ගිහි වස්ත්‍ර රැගෙන මිත්‍ර භික්ෂූන් සමග ගංතෙරට පැමිණ ගිහිවන්නට පෙර චෛත්‍යය වඳින්නෙමියි සිතා ඒ දෙසට පියවර නැගීය. එම අවස්ථාවේ එක්තරා තරුණ ස්ත්‍රියක් චෛත්‍ය ලඟට පැමිණ සෑය වඳිමින් පැන් ඉස "මේ පුණ්‍ය කර්මයෙන් භවයක් භවයක් පාසා සිවුරු හළ පුරුෂයෙක් සමග විවාහ වන්නට නොලැබේවායි" ප්‍රාර්ථනාවක් කළාය. මෙය ඇසූ තිලෝකගුරු හිමියන් එසේ ප්‍රාර්ථනා කරන්නට හේතුව කුමක්දැයි විචාළේය. ඇය පැවසුවේ "පැවිද්දා වනාහි අනුන්ගේ සිව්පසයෙන් සැපසේ ජීවත් වෙයි. ඉදින් ධර්මය ඉගෙනගනු කැමතිනම් තමන් කැමති සේ එසේ ද කළ හැකිය. අලසකමින් ධර්මය ඉගෙන නොගෙන සිටීමට ද

හැකිය. එසේ තිබියදීත් අනුන්ගේ බැල මෙහෙවර කිරීම සඳහා සිවුරු හරින පුද්ගලයා මෝඩයෙකි. එවැනි පුද්ගලයෙකුගේ භාර්යාව වන මම ද මෝඩ තැනැත්තියකි.'' එම නිසා මෙබඳු ප්‍රාර්ථනාවක් කළ බව කීවාය. මේ කථාව ඇසූ තිලෝකගුරු හිමියන් සංවේගයට පත්ව නුවර දොරටුවෙන් පිටතට ගොස් කල්පනා කරමින් සිටින විට මිත්‍ර භික්ෂූන් පැමිණ ගිහි වස්ත්‍ර භාරගන්ට යැයි කී විට උන්වහන්සේ පවසන්නේ දැන් මට පොල්ලකින් ගසා ගිහි වන්නට යැයි කීවත් එසේ නොකරමියි යනුවෙනි. ඉන්පසු ජේයය පුරයට ගොස් උගත් තෙරවරුන්ගෙන් ධර්මය ඉගෙන ගෙන ධර්ම ග්‍රන්ථ රචනා කරමින් පුඤ්ඤචෙතිය[58] නැමති මහාසෑයට දකුණු දෙස විහාරයක කල් ගෙවීය. එහිදී නොයෙක් දෙනා හට ධර්ම ශාස්ත්‍රය කියා දුන්නේය. එහි පැමිණි ඇතැම් භික්ෂූන්ට විසීමට ගෙවල් නොමැති නිසා ඔවුහු විශාල කුඩ සිටුවා ගෙපැලවල් සාදා ගත්හ. චෛත්‍යය වැඳීමට ගිය රජතුමා මෙය දැක කරුණු විමසා ගුහාවක් සහිත විහාරයක් කරවා දී ඒ තෙරුන්ට ''තිලොකාලංකාර'' යන ගෞරව නාමය ද පිදීය.[59]

මහාපවර රජුගේ අනුප්‍රාප්තිකයා වූ නරවර රජුගේ කාලයේ තිලෝකගුරු හෙවත් තිලොකාලංකාර හිමියන්ගේ ශිෂ්‍යයෙක් වූ තෙජෝදීප තෙරුන් විසින් පරිත්තටීකා නමින් පිරිත් ටීකාවක් රචනා කරන ලදි. බුද්ධදත්ත හිමියන් පවසන්නේ මේ කෘතිය තමාට හමු නොවූ නිසා මෙය සතර බණවර අටුවාවේ ටීකාව ද නැතහොත් වෙනම ම ලියූ වර්ණනාවක්දැයි කිව නොහැකි බවය. සතර බණවර පිළිබඳ දැනුමක් බුරුම රටේ භික්ෂූන්ට නොමැති නිසා මෙය එයට සම්බන්ධයක් නැතිව ලියන ලද්දක් යැයි උන්වහන්සේගේ අදහසයි.[60]

18 වෙනි සියවස බුරුමයේ දේශපාලනික අර්බුද මෙන් ම ශාසනික ඉතිහාසය තුළ ද නොයෙක් අවුල් වියවුල් තත්වයක් පැවති සියවසකි. මුල් කාල වකවානුවේ පටන් වරින්වර බුරුම හා තලයිංවරු අතර ඇති වූ දේශපාලනික මතභේදවලින්



ප්‍රයෝජන ගත් මොන්වරුන් ක්‍රි. ව. 1740 දී මුළු අවා ප්‍රදේශයම ආක්‍රමණය කොට පේගු රාජ්‍යයෙහි තමන්ගේ ම පාලකයෙක් පත් කර ගත්තේය. නව පේගු පාලකයා තම ආධිපත්‍යය ප්‍රෝම්, තෞන්ගු යන ප්‍රදේශ දක්වා ව්‍යාප්ත කළේය.[61]

ඩී. සී. පී. හෝල් පවසන පරිදි ඊළඟ වසරේ දී එනම් ක්‍රි.ව. 1741 දී පේගුවෙහි මුළු දේශපාලන ඉරණම වෙනස් විය. පේගු දේශයේ මර්මස්ථානවලට කඩා වැදුණු බුරුම භටයෝ දින තුනක සටනින් පසු සේරියම් වරාය ප්‍රදේශය ඇතුළු සියල්ල අත්කර ගත්හ. ඉංග්‍රීසීන්ගේ කඳවුරක් හැර අනිත් විදේශීය සියල්ල ගිනිබත් කළහ. ඒ අතර මොන්වරු ඉංග්‍රීසීන්ගේ කඳවුරත් ගිනිබත් කළහ.[62]

මෙම ගැටුම්කාරී තත්වය බුරුම රාජ්‍ය තුළ වරින්වර ඇතිවුණි. එමනිසා 18 වෙනි සියවස බුරුම රාජ්‍යයේ දේශපාලනික වශයෙන් අර්බුදකාරී ස්වරූපයක් ගත්තේය.

ශාසනික ඉතිහාසය තුළ ද මෙවැනි ම මතභේදකාරී බවක් ඇති වුණි. ශාසනික වශයෙන් අර්බුද ඇති වූයේ භික්ෂූන් වහන්සේලා අතර සිවුරු පෙරවීම සම්බන්ධයෙනි. ''පාරුපන'' හා ''ඒකාංශික'' විවාදය නමින් හැඳින්වූ මෙම විවාදය මේ සියවසින් අර්ධයකටත් වැඩි කාලයක් මුළුල්ලේ පැවතිණ. එක් පිරිසක් පැවසුවේ සිවුර උර දෙක ම වැසෙන සේ පොරවාගතයුතු බවය. අනෙක් පිරිස පැවසුවේ සිවුර ඒකාංශ කොට සිටිය යුතු බවත්ය.

සාහිත්‍යය දියුණු කිරීම සඳහා මේ යුගයේ ප්‍රසිද්ධියට පත්ව සිටි තෙරවරුන් ලෙස දැක්වෙන්නේ ඤාණාභිවංස, ඤාණවර හා සාරදස්සි යන තෙරවරුය. සාරදස්සි නමින් තෙර නමක් 17 වෙනි සියවසේ දී ද සිටි අතර උන්වහන්සේ අවා වැසි භික්ෂුවකි. 18 වෙනි සියවසේ සිටි සාරදස්සි හිමියන් පගාන් වැසි භික්ෂුවකි. මේ තෙරවරුන් අතරින් ඤාණාභිවංස හිමියන් බුරුමයේ සංඝරාජ පදවිය ඉසිලූ තෙරුන් වහන්සේය. බුරුම මූලාශ්‍රයන්හි සඳහන්

වන පරිදි ලක්දිව උපසම්පදාව අපේක්ෂාවෙන් ඤාණවිමලතිස්ස හිමියන් තවත් සාමණේරවරුන් පිරිසක් සමඟ බුරුමයට පැමිණියේ මෙම සංඝරාජයන් වහන්සේගේ සමයේ දී ය. සාසනවංශයෙහි සඳහන් වන පරිදි උන්වහන්සේලාට අනුග්‍රහ කළ බුරුම රජු වූයේ සිරිපවර විජයානන්තය සත්‍රිභුවනාදිත්‍යාධිපති පණ්ඩිතමහාධම්මාධිරාජ රජුය.[63]

මෙම දීර්ඝ අභිධානයෙන් හැඳින්වෙනුයේ බෝදාපායා (ක්‍රි. ව. 1782-1818) රජු බව සැලකේ. අභිධාන රාශියක් භාවිතා කළ මේ රජු සිය රාජ්‍ය කාලය ආරම්භ කරන්නේ මනුෂ්‍ය ඝාතනයකිනි. සගායින්හි ඇති වූ කැරැල්ලක් මැඩ පැවැත් වූ මේ රජු එහි ජීවත් වූ තිරිසන් සතුන් ඇතුළු සෑම ප්‍රාණියෙකු ම ද ගස් කොලන් ද විනාශ කළේය. ආරම්භයේ දී කළ දරුණු ක්‍රියා නිසාමදෝ පසුකලෙක දැඩි සේ ආගමට ලැදිව කටයුතු කිරීමට පෙළඹී සිටියේය. මත්පැන් බොන්නන්ට ද, ගවාදි සතුන් මරන්නන්ට ද, අබිං පාවිච්චි කරන්නන්ට ද දැඩි සේ දඬුවම් නියම කළේය.[64]

සඟ සසුන ද ප්‍රතිසංස්කරණය කිරීමට පසුබට නොවූ බෝදෝපායා රජු දිගු කලක් තිස්සේ බුරුමයේ පැවති ඒකාංශ හා පාරුපන වාදය නිමාවට පත් කළේය.[65]

සියලු දෙනා වහන්සේ ම උභයාංශ පාරුපනය පිළිගත යුතුය යන්න තත්කාලීන බුරුම සඟරජතුමන්ගේ උපදෙස් පරිදි බෝදෝපායා රජු විසින් කරන ලද ආඥාව විය.

ඤාණාභිවංස තෙරුන්ගේ ග්‍රන්ථ වූයේ පෙටකාලංකාර නම් නෙත්තිප්පකරණයේ ටීකාව, සාධුවිලාසිනි නම් දීඝනිකායේ කොටසක ව්‍යාඛ්‍යාව හා රාජාධිරාජවිලාසිනි නම් කාව්‍ය ග්‍රන්ථයයි. එසේම චතුසාමණේරවත්ථු හා රාජවාදවත්ථු නමින් භාවාත්මක ප්‍රකාශන ඇතුළත් ග්‍රන්ථ දෙකක් ද රචනා කළේය. බුරුම පාලි සාහිත්‍ය සම්ප්‍රදාය බොහෝ සෙයින් ව්‍යාකරණ, සූත්‍ර, විනය හා අභිධර්ම අධ්‍යයනයන් කෙරෙහි වැඩි නැඹුරුවක්



තිබුණත් පසුකාලයේ දී එම ක්‍රමවේදය වෙනස් වී ඡන්දොලංකාර, ජ්‍යොතිෂය, වෛද්‍ය ශාස්ත්‍රය, ඉතිහාසය වැනි අංශ කෙරෙහි යොමු වීමක් දක්නට ලැබේ. 18 වන සියවස වනවිට පාලි ප්‍රබන්ධ සාහිත්‍යයේ දියුණුවක් ඇති වීම ද මේ යුගයේ සුවිශේෂී ලක්ෂණයක් වෙයි. බුරුමය පාලනය කළ කීර්තිමත් නරපතීන්ගේ චරිත, ලෝක ශාසනික සේවා, අභිෂේක චාරිත්‍ර විධි ආදි විස්තර මේ ග්‍රන්ථවල ඇතුළත් වේ. රාජකථා වැනි ලෞකික විෂයයන් පිළිබඳ ඍජුව ම ග්‍රන්ථ රචනා කිරීම භික්ෂු විනයට පටහැනි වන හෙයින් ඉන් නිදහස්වීම සඳහා මේ කෘතිවලට ආගමික තොරතුරු ද ආරෝපනය කරන්නට ඔවුහු පෙළඹුණහ.

මේ අයුරින් බුරුම පාලි සාහිත්‍ය 18 වෙනි සියවස දක්වා ව්‍යාප්ත වෙමින් පැවතුණ අතර ඒ කාලවකවානුවේදී ත්‍රිපිටක, අටුවා, ටීකා, ප්‍රකරණ ආදි විවිධ අංශයන්හි ග්‍රන්ථ රචනා වී ඇත. විශේෂයෙන් ම අභිධර්ම පිටකයට ලියවුණු සංග්‍රහ ග්‍රන්ථ, සංවර්ණනා ග්‍රන්ථ වර්තමානයේ ද අභිධර්මය හැදෑරීමේ දී බෙහෙවින් ඉවහල් වන බව කිව හැකිය. ඒ අනුව බුරුම පාලි සාහිත්‍යය ලංකා පාලි සාහිත්‍යය තරමට ම ව්‍යාප්ත වූ හා සුවිශේෂී බවක් උසුලන බව කිව හැකිය.

## ආන්තික සටහන්

1 Bischoff, Roger, Buddhism in Myanmar, pp. 10

2 Hazra, kanai Lal, History of Theravada Buddhism in South East Asia, with Special Reference to India and Ceylon, pp. 60-64

3 Bode, Mabel Heynes, The Pali Literature of Burma, pp. 8.

4 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 446- 447.

5 Bode, op.cit. 16.

6 උතුරු බුරුමයේ අගනුවර වූ පගාන් දේශය භික්ෂූන් විසින් හඳුන්වා ඇත්තේ අරිමද්දන පුරවරය යන නමිනි. මීට හේතු වුයේ උතුරු බුරුමයේ

පාලකයා වූ අනුරුද්ධ (ක්‍රි. ව. 1044-1077) රජු විසින් කරන ලද අරි භික්ෂූන් මර්දනය කිරීමේ කර්තව්‍යය සිහිකිරීම් වශයෙනි.

බලන්න. මූර්ති, ලංකාව සහ බුරුමය, දෙවෙනි පරිච්ඡේදයේ 38 වන අධෝ ලිපිය, පි. 22

7 ලංකාදීප පරදීපවාසීනං සොතුජනානං පරියත්තිං පරියාපුණන්තෙන සුවිසුද්ධ බුද්ධි විරිය සීලාචාර ගුණසමන්නාගත තිපිටකධර ගරු ගහිත සද්ධම්මජොතිපාලොති නාමවිහයෙන ථෙරෙන කතො සොතූනං පීතිවඩ්ඪනකො නාමචාරදීපකො නාම නිට්ඨිතො. (උපුටා ගන්නා ලද්දේ බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 330.

8 Gandhavamsa, Ed. J Minayefe, pp.74.

9 මෙහි කතුවරයා පිළිබඳව සඳහනක් නොමැතිමුත් මුඛ පරම්පරාගතව එන්නේ විමුලබුද්ධි නම් තෙර නමක් විසින් රචිත බවය. බුරුම බසින් ලිය වී ඇති නිසා මුන්වහන්සේ බුරුම වැසි භික්ෂුවක් යැයි සඳහන් වේ. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 431.

10 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 465.

11 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 466.

12 මුන්වහන්සේ බුරුම රට සාවවු නැමති ගමේ උත්පත්තිය ලබා ඇත. කුඩා කාලයේ දී අකුරු ඉගෙනීමට පියා විසින් තෙර නමකට භාරදෙන නමුත් මොහු පන්සලට නොගොස් සෙල්ලම් කළ බැවින් වරක් පියා විසින් කටු ගසකට නංවන ලදි. ඉන්පසු කණ්ටකක්ඛිප යන නම ලැබුණි. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 467.

13 උපාධ්‍යාය, භරතසිංහ, පාලි සාහිත්‍ය ඉතිහාසය, (පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි,) පි. 457-458

14 මෙම ඇමතියා අන්තඃපුර ස්ත්‍රියකගේ දියණියකට පෙම් බැඳි බව දැනගත් රජතුමා පාලියෙන් ග්‍රන්ථයක් රචනා කරන්නේ නම් කුමරිය දෙන බව කීය. ඉන්පසු න්‍යාසප්පදීපය කරවා පෙන් වූ පසු කුමරිය හා රජ්ජුග්ගාහක තනතුර ද දුන්නේ යැයි බුරුම සාසන වංශයේ සඳහන් වේ. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 432.

15 මොහු සද්දසාරත්ථජාලිනිය කළ කණ්ටකක්ඛිප තෙරුන්ගේ උගත්කම විමසීම සඳහා සීහසූර නම් නරපතියා විසින් යවන ලද ඇමතියාය. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 496.

16 Geiger, W., Pali Language and Literature, pp. 22



17 මුලින් පැවිදිව සිට ධර්ම විනය හැදෑරූ කෙනෙකි.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 364.

18 කල්‍යාණි ශිලා ලිපියෙහි සඳහන් වන්නේ තමා රාජ්‍යයට පැමිණෙන විට රටේ උපසම්පදා විනය කර්මය නිසියාකාරව නොපැවති නිසා කෝට්ටේ රාජ්‍ය ගෙනගිය සවැනි භුවනෙකබාහු වෙත ඇමතියන් දෙදෙනෙකු හා සඟ පිරිස් දෙකක් එවා කැලණි ගඟේදී විදාගම මාහිමියන් ප්‍රමුඛ සංඝයාගෙන් උපසම්පදාව ලබාගෙන ගිය පසු එරට හංසාවතී නුවර (වර්තමානයේ පේගු) අසල ගමක තමාගේ සංවිධානය හා ආරක්ෂාව සහිත ව සීමාවක් බන්දවා එයට කැලණි ගඟේ නම ගෙන ''කල්‍යාණි සීමා'' යැයි නම් තබා සංඝයාට අළුතෙන් උපසම්පදාව දුන් සැටිය.

19 මෙය භාරතීය මනුනීතිය වැනි ග්‍රන්ථයන්ගේ බලපෑමෙන් රචනා වූවකි. බලන්න, Bode, op.cit., pp. 51.

20 Sasanavansa, (Ed.) M.H. Bode, pp.42

21 පස්වැනි පරාක්‍රමබාහු තුන්වෙනි වික්‍රමබාහු වෙතින් පරාජය වීමෙන් කණස්සල්ලට පත් වී රාමඤ්ඤ දේශයට වැඩි බව විශ්වාස කරනු ලැබේ.

22 අදිකාරි, ඒ. ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන, පි. 115-116

23 තතො පච්ඡා ච මුත්තිම නගරෙ සෙතිභින්දස්ස රඤ්ඤො මාතුයා ආචරියො මෙධංකරො නාම ථෙරො සීහළදීපං ගන්ත්වා සීහළදීපෙ අරඤ්ඤවාසීනං මහාථෙරානං සන්තිකෙ පුනසික්ඛං ගහෙත්වා පරියත්තිං පරියාපුණිත්වා සුවණ්ණරජතමයෙ තිපුසීසච්ඡන්නෙ සෙතිභින්දස්ස රඤ්ඤො මාතුයා කාරාපිතෙ විහාරෙ නිසීදිත්වා සාසනං පග්ගහෙසි. ලොකප්පදීපකසාරං ච නාම ගන්ථං අකාසි. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 376-377.

24 Bode, op.cit., pp. 35-36.

25 ඉති සංකප්පමඤ්ඤාය මහානන්දොති විස්සුතො
මහාථෙරොති විස්සුතො ඉමමත්ථං විචින්තයී

26 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 252

27 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 252

28 උපාධ්‍යාය, භරතසිංහ, පාලි සාහිත්‍ය ඉතිහාසය, (පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි,) පි. 459-460.

29 වසන්තෙනෙත්ථ ධීරෙන ථෙරෙන ඤාණකිත්තිනා
අට්ඨසාලිනියා අත්ථයොජනා සාධු සංඛතා

30 Saddhatissa, H., Pali Literature of South East Asia, pp.17

31 koyedes, G., The Making of South-East Asia, Eng.tr. by W.M wright, pp. 182

32 Ray, N.R., Theravada Buddhism in Burma, 196-197

33 Bode, op.cit., pp. 37.

34 දාඨානාගරාජගුරූති ලද්ධනාම ලඤ්ජනෙන ථෙරෙන පුරෙ ගරූහි සද්ධම්මසිරීති ගහිත නාම ධෙය්‍යෙන සිරිනන්දධම්මරාජපවරාධිපතිනාම්නා යථාධම්මං උද්ධරාජභාවස්ස රාජසම්පත්‍යනුභවනකාලෙ සාසනෙ ද්වානවුතාධික එකවීසසතකාලෙ සක්කරාජෙ පන දසාධික සහස්සකාලෙ සම්පත්තේ රචිතං නිරුත්තිසාර මඤ්ජුසා නාම පකරණං සමත්තං

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 234

35 මූර්ති, ලංකාව සහ බුරුමය, පි. 95

36 Hall, D. C. P. A History of South-East Asia, pp. 265

37 Ibid, pp. 269

38 Ibid, pp. 269

39 සාසනං තස්ස සෙට්ඨස්ස අට්ඨවස්සසතාදිකං
ද්විසහස්සං යදා පත්තං නිස්සලං වඩ්ඪනං සුභං

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 248.

40 සම්බන්ධපාල නාමෙන මහාධම්මරාජගුරුනා මහාථෙරෙන රචිතා ජිනපුත්තානං හිතකරා නෙත්තිවිභාවනා ඡබ්බීසාධිකනව සතසකරාජෙ සරවණමාසෙ සුක්ඛපක්ඛෙ නවමදිවසෙ සුරියුග්ගමනසමයෙ නිට්ඨිතා

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 248.

41 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 492.

42 ගන්ථාභරණ ටීකායං විජයාරාමවාසිනා
සුවණ්ණරංසි නාමෙන සංඝරාජෙන ධීමතා

43 මෙහි ''තලයිං'' යනුවෙන් හඳුන්වන්නේ භාෂාවක්ය. ධම්මචේතිය රජු (1472-1492) විසින් ශිලා ලිපියක ලියවන ලද කල්‍යාණි ශිලා ලිපිය පාලියෙන් හා තලයිං භාෂාවෙන් ලියා තැබූ බව සඳහන් වේ. ඒ අනුව



ඇතැම්විට මෙය බුරුම භාෂාව හැඳින්වීම සඳහා භාවිතා වූ වචනයක් විය හැකිය.

මූර්ති, ලංකාව සහ බුරුමය, පි. 74.

44 බාවිසාසු ද්විවස්සෙ නාරියලංකාර නාමිනා
සත්ථන්තරෙසු ඤායං ච කවිස්සරෙන'හිමතං
නයමොගය්හ කතො'යං පරමත්ථවිනිච්ඡයො
සාසනෙ පඤ්ඤාසෙක සතද්විසහස්සතෙ

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 248.

45 මූර්ති, ලංකාව සහ බුරුමය, පි. 146.

46 වාචිස්සර හිමි, කොටගම, සරණංකර සංඝරාජ සමය, පි. 55

47 උපාධ්‍යාය, භරතසිංහ, පාලි සාහිත්‍ය ඉතිහාසය, (පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි,) පි. 460.

48 රාජවංස පර්වතය පිළිබඳ තොරතුරු වාචකොපදේස ටීකාවේ සඳහන් වේ. ''සෙගයිංහිඛ්‍යාතපුරස්ස පච්ඡිමද්වාරඅන්තිකෙ රම්මෙ සන්තානාමවාසෙ රාජපබ්භාරපබ්බතෙ'' සගයින් නැමති නගරයට බටහිරින් දොරටුව අසල පිහිටි රම්‍ය වූ, ශාන්ත පුද්ගලයන්ට වාසස්ථානයක් වූ රාජපබ්බත නැමැති පර්වතයක් ඇත. එහි සර්වඥයන් වහන්සේගේ ධාතු නිධන් කොට ඇති මහියංගණ නම් චෛත්‍යයක් ද ඇත.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 453

49 බොධොදධිසුතෙ ගාමෙ ජාතෙන ජාතියා මයා
ජම්බුධජොති නාමෙන කතො නිරුත්තිසංගහො

50 උපාධ්‍යාය, භරතසිංහ, පාලි සාහිත්‍ය ඉතිහාසය, (පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි,) පි. 460.

51 උපාධ්‍යාය, භරතසිංහ, පාලි සාහිත්‍ය ඉතිහාසය, (පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි,) පි. 460.

52 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 434.

53 පුබ්බාචරිය සෙට්ඨානං නයං නිස්සාය සාසනෙ
වක්කං බාලෙ විකාසෙතුං වාචමුපදෙසකං

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 451.

54 උත්තමසික්ඛා යස්ස උත්තමං සික්ඛතීති වා
උත්තමසික්ඛො'තිවිහෙන ථෙරෙන උපසම්පදා

සත්තරසහි වස්සෙහි සම්පන්නේන ච හික්ඛුනා
සීලාදි ගුණ පුණ්ණේන කච්චානහෙදවණ්ණනා
එකතිංසාධිකෙ සක්කරාජෙ සහස්සකෙ කතා
ගන්ථො කණ්ඩෙහි පරිපුණ්ණො යථා අයං
දසහි පාරමිතාහි සම්පජ්ජාමි භවාභවෙ
සාසනං යාවතා ලොකෙ චිරං තිට්ඨති තාවතා
තිට්ඨතු ච අනාකුලා කච්චාණහෙදවණ්ණනා

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 445.

55 ඉති සද්ධම්මගුරු නාමෙන ථෙරෙන කතං සද්දවුත්තිපකාසකං නාම සද්දප්පකරණං සමත්තං

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 459.

56 Bode, Mabel Haynes, The Pali Literature of Burma, pp. 56-57

57 උපාධ්‍යාය, භරතසිංහ, පාලි සාහිත්‍ය ඉතිහාසය, (පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි,) පි. 460.

58 බුරුම බසින් කුසොතෝ යයි කියත්.

59 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 261-262.

60 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, පි. 261.

61 Hall, D. C. P. Europe and Burma, pp 58.

62 Hall, D. C. P. Europe and Burma, pp 58.

63 Sasanavansa, (Ed.) M.H. Bode, pp. 142

64 Hall, D. C. P., The History of shouth East Asia, pp. 584.

65 Sasanavansa, (Ed.) M.H. Bode, pp. 142